සතිය :- 03
අප්‍රේල්

විෂය:- **පෙරදිග සංගීතය**

ශ්‍රේණිය :- 10

Prepared by - **දෙහිඕවිට අධ්‍යාපන කලාපය**

## ***ස්වර ලිපි කියවීමේ ක්‍රම ශිල්ප*** - (මැදුම් මහ දෙතිත / 7/8Beat / දීප්චන්දි තාලය )

මෙම සතියේ දී මාත්‍රා තුනෙන් හතරට (මැදුම් මහ දෙතිත/7/8Beat /දීප්චන්දි තාලය)ස්වර ප්‍රස්ථාර කරන ආකාරය පිළිබඳ ව විමසා බලමු. පහත දැක්වෙන්නේපළමු විභාගයේ මාත්‍රා තුන බැගින් ද දෙවන විභාගයේ මාත්‍රා හතර බැගින්ද බෙදෙන ස්වර ප්‍රස්ථාරයකි. ස්වර ප්‍රස්ථාරය කියවන්නේ වමේ සිට දකුණට ය.

| | | | |
|---|---|---|---|
| X | X | X | X |
| 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
| වන් වූ ත්‍රී | වන් වූ ත්‍රී ෆෝ | වන් වූ ත්‍රී | වන් වූ ත්‍රී ෆෝ |

ඉහත ප්‍රස්ථාරයේ x සළකුණ තිබෙන ස්ථානයේ මාත්‍රාව ට අත්පුඩි ගසමින් **වන් , වූ, ත්‍රී, වන් , වූ , ත්‍රී, ෆෝ** යනුවෙන් තාලයට හඬ නගන්න. නැවත නැවත නොනවත්වා විනාඩි කිහිපයක් ඒකාකාරී වේගයකින් අත්පුඩි ගසමින් තාලයට හඬ නගන්න. පහතින් දක්වා ඇත්තේ මාත්‍රා තුනෙන් හතරට විභාග කරන ලද ප්‍රස්ථාරයක විවිධ මාත්‍රා වටිනාකම් සහිත ස්වර ප්‍රස්ථාරයකි. මීටපෙර සති වල දැනුම ද සිහිපත් කරමින් ස්වර පුවරුවකින් වාදනය කරන්න.

| | | | |
|---|---|---|---|
| X | X | X | X |
| 1 2 3 | 4 5 6 7 | 8 9 10 | 11 12 13 14 |
| වන් වූ ත්‍රී | වන් වූ ත්‍රී ෆෝ | වන් වූ ත්‍රී | වන් වූ ත්‍රී ෆෝ |
| ස ස ස | ස ස ස ස | ස - ස | ස - ස - |
| ස රි - | ග - - රි | ගම ග -රි | ගම පම ගම ග |
| + ග+ ගරි | ස ස - - | - ග ම | ප ම ග - |
| + සස සස | රිරි ගග රි - | ස - - | ස - - ස |

පහත ගීත තාල තබමින් ශ්‍රවණය කරන්න. ස්වර ප්‍රස්ථාර සොයා ගන්න. වාදනය කරන්න.

1.ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන

2.රන් මලක් ලෙස දෙව් බඹුන්

3.සොයා පිළිසරණක් ලොවෙන් මා

4.සිනාවෙන් හෝ කතාවෙන් බෑ

5.සැඳෑ කළුවර කුරගගා විත්

6.සිනහවෙනු මැන වේදනා පිසදා

7.සදාකාලික නොවූ ලෝකේ